රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2018

මගේ අංකය : EST-7/COMPT/02/3000/4
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.06.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අනතුරුදායක රැකියාවල නිරතවීමේ දී හෝ තනතුරට පැවරී ඇති රාජකාරී ඉටු කිරීමේ දී වැළඳෙන රෝග හේතුවෙන් මරණයට පත්වන රාජ්‍ය නිලධරයන්ගේ යැපෙන්නන්ට වන්දි ලබාදීම</u>**

ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන හෝ නොදරන රජයේ නිලධරයකු අනතුරුදායක රැකියාවක නිරතවීමේ දී හෝ තනතුරට පැවරී ඇති රාජකාරී ඉටුකිරීමේ දී හෝ වැළඳෙන රෝග හේතුවෙන් මරණයට පත්වුවහොත් ඔහුගේ යැපෙන්නන්ට වන්දි ගෙවීමට 2017.08.15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කරන ලදී.

02. ඒ අනුව මෙවැනි අවස්ථාවන්වල දී ආයතන ප්‍රධානීන් විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සුදුසු වේ.

I. රාජ්‍ය සේවයේ නිලධරයන් අනතුරුදායක රැකියාවල නිරතවීමේ දී හෝ තනතුරට පැවරී ඇති රාජකාරී ඉටු කිරීමේ දී වැළඳෙන රෝග හේතුවෙන් මිය ගියහොත් ඒ එක් එක් වන්දි අයදුම්පත්, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එකී රෝගය වැළඳීම වැළැක්වීමට ගත හැකිව තිබූ ක්‍රමවේදයන් ඉටු කර තිබූ බවට වන සහතිකයක් ද සමඟ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

II. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථාපිත වෛද්‍ය සේවා අතිරේක ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු, මියගිය නිලධරයාට වැළඳී ඇති රෝගය අනුව පත් කරනු ලබන විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකුගෙන් යුත් කමිටුවට ඉහත අයදුම්පත ඉදිරිපත් කිරීම.

III. මෙම කමිටුවේ නිර්දේශය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවීම.

IV. එකී කමිටු නිර්දේශය අනුව අදාළ නිලධරයාගේ යැපෙන්නන් වෙත වන්දි ගෙවීම සඳහා වන යෝජනාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් ක්‍රියා කිරීම.

03. නිලධරයා මිය ගිය දිනට ලද දීමනා රහිත මාසික වැටුප මෙන් මාස එකසිය විස්සක (120) වැටුපක් අමාත්‍ය මණ්ඩල අනුමතිය මත ඔහුගේ යැපෙන්නන් වෙත ගෙවීමට අදාළ ආයතන ප්‍රධානියා විසින් පියවර ගත යුතුය.

04. මෙම වන්දි මුදල අදාළ අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති එම වර්ෂයට අදාළ ප්‍රතිපාදනවලින් ගෙවිය යුතුය.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය